සැ. යු. - 2022.02.03 වැනි දින පළ වූ අංක 2266 දරන ගැසට් පත්‍රයේ III හා IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,267 - 2022 පෙබරවාරි මස 11 වැනි සිකුරාදා - 2022.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — | රජයේ නොවන දැන්වීම් ... ... ... | 277 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 274 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 284 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | | |

**සැ.යු.-** (i) අධිභාර බද්ද පනත් කෙටුම්පත 2022 පෙබරවාරි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සත්ව සුබසාධන පනත් කෙටුම්පත 2022 පෙබරවාරි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 මාර්තු මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 පෙබරවාරි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

273 - B 82315 - 5,403 (2022/02)

# බඩු බාහිරාදිය විකිණීම්

**මහාධිකරණය - මොණරාගල**

රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ හා භාණ්ඩ සමීක්ෂණ මගින් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොණරාගල ඌව පළාත්බද මහාධිකරණයේ පවරන ලද දූනට අවසන් වී ඇති නඩුවලට අදළ භාණ්ඩ හා 2019 හා 2020 භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලට අනුව ඉවත් කරන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ පහත කොන්දේසි වලට යටත්ව **2022.02.25 වැනි දින පෙ. ව. 9.00 ට** මෙම අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට ප්‍රථම මහජනතාවට භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

02. තක්සේරු මිල හෝ ඊට වැඩිමිලට ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමේ බලය අධිකරණය සතු ය.

03. භාණ්ඩ මිලදී ගැනීමට අදළ මුදල් එවෙලේ ම ගෙවිය යුතු අතර, වෙන්දේසිය පවත්වන දින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් භාණ්ඩ ඉවත් කර ගත යුතු ය. ගෙවීම් සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි වලංගු හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

05. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

06. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවකදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී

එන්. ඒ. සුවන්දුරුගොඩ,
මහාධිකරණ විනිසුරු,
මොණරාගල.

2022 ජනවාරි මස 06 වැනි දින,
ඌව පළාත්බද මොණරාගල මහාධිකරණයේ දී ය.

**භාණ්ඩ ලැයිස්තුව**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩය* |
|---|---|---|
| 01. | 198/2019 | උදැල්ල |
| 02. | 76/2017 | ජංගම දුරකථනය |
| 03. | 305/2019 | පා පැදිය |
| 04. | 51/2018 | SPABG 4532 දරන ත්‍රීරෝද රථය |
| 05. | 60/2018 | UP 152 - 6928 දරන හොණ්ඩා යතුරුපැදිය |
| 06. | 37/2010 | 149 - 6285 යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 07. | 03/2020 | UP JV 4383 (CT 100) යතුරු පැදිය |
| 08. | 03/2020 | SGQJ 0946 පියාජියෝ ත්‍රීරෝද රථය |
| 09. | 185/2018 | SGWE 5330 ප්ලැටිනා යතුරු පැදිය |

**කාර්යාල උපකරණ**

01. ඔරලෝසු 04
02. වතුරු ෆිල්ටර් 02
03. සිවිලිං ෆෑන් 10
04. කී බෝඩ් 02
05. මවුස් 01
06. ලේසර් ප්‍රින්ටර් 02
07. UPS 06
08. ෆැක්ස් මැෂින් 01
09. පරිගණක පුටු 03
10. බොයිලේරු 01
11. පැරණි උළු තොගය
12. වීදුරු පෑඩ් 02
13. කතුරු 01
14. ස්ටේප්ලර් මැෂින් 05
15. ගණක යන්ත්‍ර 06
16. දින මුද්‍රා 01
17. පංචර් 01
18. මල්ටි ප්ලග් 02
19. ස්පොන්ච් හෝල්ඩර් 01
20. විදුලි පංකා (ලොකු) 01
21. ලිපිකරු පුටු (කුෂන් සහිත) 11
22. ඇඳි පුටු (ලී) 03
23. පරිගණක පුටු 01

02- 68

## දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය

දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු වලට අදාලව නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කර තිබූ, මෙතෙක් හිමිකම් පාන්නකු ඉදිරිපත් නොවූ වාහන රාජසන්තක කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා පියවර ගැනීමට සිදු වී ඇත.

එබැවින් පහත විස්තර සඳහන් රථවාහන සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු සිටීනම් මෙම නිවේදනයේ දින සිට මාස 02ක් ඇතුලත හිමිකම් පෑමට අදල ලේඛන සමඟ දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වී දැනුම් දෙන ලෙස මෙයින් දන්වමි.

### හිමිකම් නොපාන ලද වාහන විස්තර ලැයිස්තුව

| *අනු අංකය* | *නඩු අංකය* | *වාහන විස්තරය* |
|---|---|---|
| 01. | 31513 | EP BIQ 9331 යතුරුපැදිය |
| 02. | B 452/16 | EP MQ 8722 යතුරු පැදිය |

ඩබ්. එම්. අයි. වාසල,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
දෙහිඅත්තකණ්ඩිය.

02-75

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - මඩකලපුව

### ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාග වලදී රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ **2022.02.20 වැනි දින පෙරවරු 9.00** ට මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට නියමිතය.

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල, තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් එම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහිදී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසිය සිදු කරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගීවීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

ඒ. සී. රිස්වාන්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මඩකලපුව.

2022 පෙබරවාරි මස 01 වැනි දින.

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය

| *අංක* | *නඩු අංකය* | *ලියාපදිංචි අංකය* | *භාණ්ඩ* | *අයිතම ගණන* |
|---|---|---|---|---|
| 1. | 63294/MT/21 | EP MA- 9590 | යතුරු පැදිය | 01 |
| 2. | 63817/ODD/21 | EP BCT- 8535 | යතුරු පැදිය | 01 |
| 3. | 63918/E/21 | EP BHQ-8742 | යතුරු පැදිය | 01 |
| 4. | AR/817/21 | | පාපැදිය | 01 |
| 5. | 56390/PC/19 | | Motor Parts | 01 |
| 6. | 58901/S/19 | | Hand Phone | 01 |
| 7. | 58901/S/19 | | Shawl | 03 |
| 8. | 64981/S/22 | | Shawl | 01 |
| 9. | 63878/S/21 | | Shawl | 01 |
| 10. | 41765/E/16 | | Aluminium pot | 01 |
| 11. | 43738/E/17 | | Empty Barrol | 01 |
| 12. | No Number | | Empty Barrol | 10 |
| 13. | No Number | | Axe | 01 |
| 14. | No Number | | Crow bar tool | 01 |
| 15. | No Number | | Big Knife | 01 |

02-114

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - බලන්ගොඩ

### අධිකරණය විසින් රාජසන්තක කරන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

බලන්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ **2022.03.05 වැනි දින පෙ. ව. 9.00** ට පමණ මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම වෙන්දේසිය කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 8.00 ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් සිදුකළ යුතු ය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව තිබේ.

වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
බලංගොඩ.

2022 ජනවාරි මස 25 වැනි දින,
බලන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව - 2022.03.05

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ වර්ගය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 66763, 41520, 79023, 54041, 58685, 35755, 72399, 60413, 60050, 38380, 39111, 47982, 71531, 57793, 74760, 86564, 86570, 86566, 86571, 86567, 86565, 86568 | උදලු | 26 |
| 02. | 49961, 66226, 35735, 84426 | ඇඳුම් උදලු | 04 |
| 03. | 47982, 83098 | සවල් | 02 |
| 04. | 54785, 53021, 64381, 63770, 62726, 67483, 81290 | ජංගම දුරකතන | 07 |
| 05. | 66763, 41520, 79023, 54041, 40115, 72399, 60050, 86569 | ඉල්ලන් කුරු | 09 |
| 06. | 86340, 67429 | පොරව | 02 |
| 07. | 41520, 60413, 47982, 69133, 84426 | ගැරුම් වට්ටි | 05 |
| 08. | 41520, 86300, 79023, 54041, 58586, 71531, 86471, 84426, 86570 | වේවැල් කුඩ | 13 |
| 09. | 41520, 38380, බී 185/21 | කුළු ගෙඩි | 03 |
| 10. | 86331, 83395 | කළ ගෙඩි | 02 |
| 11. | 22902 | ඇලුමිනියම් මුට්ටි | 02 |
| 12. | 47982 | පිකෑස් | 01 |
| 13. | 86340, 54041 | විදුලි පන්දම් | 02 |
| 14. | 47592 | ලන්තෑරුම් | 01 |
| 15. | 60050 | තාච්චි | 01 |
| 16. | 47592, 74727 | ප්ලාස්ටික් බාල්දි | 02 |
| 17. | 68477 | ගෑස් ලිප් | 01 |
| 18. | 85891 | ජබොස් වතුර මෝටර් | 01 |
| 19. | 63486, බී 460/13 | හෝස් බට | 02 |
| 20. | 76181 | යකඩ කැට කුඩ | 01 |
| 21. | අංක රහිත | ප්ලාස්ටික් බූලි තොගය- | |
| 22. | අංක රහිත | වීදුරු බෝතල් තොගය- | |
| 23. | අංක රහිත | ප්ලාස්ටික් වතුර ටැංකි (500L) | 01 |
| 24. | 86557, 86560 | සිමෙන්ති (50kg) | 02 |
| 25. | 85815 | යූරියා මිටි (50kg) | 01 |
| 26. | AR 98/2021 | WPMW 0696 යතුරු පැදිය | 01 |
| 27. | 65308 | SGPD 9430 කැරවන් වෑන් රථය | 01 |
| 28. | 60662 | SGYU 5268 ත්‍රීරෝද රථය | 01 |

02-69

**පොළොන්නරුව මහෙස්ත්‍රාත් අධිකරණය**

වැලි කියුබ් 21ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පොළොන්නරුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරන ලද වැලි කියුබ් 21ක් **2022.02.17 වැනි දින පෙ. ව. 9.00** ට පොළොන්නරුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසියේ මිළ දී ගනු ලබන වැලි සඳහා මුදල් ගෙවීමේ දී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදු කළ යුතු අතර චෙක්පත්, බැංකු අණකර කිසිවක් භාරගනු නොලැබේ.

03. වැලි මිලදී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද වැලි වෙන්දේසිය පවත්වන දිනයේ දී ප. ව. 5.00 ට පෙර අදල භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම්, වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

06. සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් වෙන්දේසිය සඳහා සහභාගී වන ලෙස දන්වා සිටිමි.

හර්ෂණ ධනුෂ්ක රත්නායක,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
පොළොන්නරුව.

2022 පෙබරවාරි මස 01 වැනි දින,
පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *අධිකරණය පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය* | *වැලි කියුබ් ප්‍රමාණය* |
|---|---|---|
| 01. | පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ | 21 |

02-70

# රජයේ නොවන දැන්වීම්

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *සමාගම් නාමය* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය* | *ලියාපදිංචි කළ දිනය* |
|---|---|---|---|
| අයිකොනික් ලෑන්ඩ් හෝල්ඩින්ග්ස් (පීවීටී එල්ටීඩී) | පීවී 00250944 | අංක. 168 3/1, කමතවත්ත පාර, මැදවැලිකඩ, රාජගිරිය. | 2021.12.30 |
| අයිකොනික් රෙසිඩන්සස් (පීවීටී) එල්ටීඩී | පීවී 00251030 | අංක. 168 3/1, කමතවත්ත පාර, මැදවැලිකඩ, රාජගිරිය. | 2021.12.31 |

ඉහත සමාගම් වෙනුවෙන් ලීඩ්ස් කෝර්පරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
84 බී, පොල්ගස්ඕවිට පාර, මත්තේගොඩ.

02-106

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත දක්වා ඇති සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නම : සන් ඩිවලොපර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 3819
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 295, මාදම්පිටිය පාර, කොළඹ 14
සමාගමේ අලුත් නාමය : ජේස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්

ජී ඩබ්ලිව් සෙක්‍රටරීස් ඇන්ඩ් එකවුන්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
සමාගම් ලේකම්වරු.

02-67

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නුගේගොඩ, පීටර් පෙදෙස, සපරමාදු මාවත, අංක 14/7 හි පදිංචි ජා. හැ. අ. 718282705 V වෛද්‍ය මල්වල ආචාරිලාගේ ශාරිකා ලසන්ති පීරිස් වන මා විසින් 2020 දෙසැම්බර් මස 21 වැනි දින අංක 8994 දරන සී. එස්. හෙට්ටිආරච්චි ප්‍රසිද්ධ නොතාරිස් විසින් නුගේගොඩ දී සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි බලකරු ලෙස නම් කළ නුගේගොඩ, පීටර් පෙදෙස, සපරමාදු මාවත, අංක 14/7 හි පදිංචි ජා. හැ. අ. 410631008 V දරන මල්වල ආචාරිලාගේ ලියෝ පීරිස් මහතාට දී ඇති ඇටෝර්නි බලය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකාවාසී සියලු ජනතාවගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශ කරමි.

වෛද්‍ය මල්වල ආචාරිලාගේ ශාරිකා ලසන්ති පීරිස්.

02-107

---

## ජේබීඑස් ෂිපිං සර්විසස් ලිමිටඩ්

(සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත්)

සමාගම් ලියාපදිංචි අංකය PB 1479)

### අවසන් මහා සභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 331(2) වගන්තිය යටතේ සෑහීමකට පත් වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන අවසන් මහා සභා රැස්වීම 2022 මාර්තු මස 10 වැනි දින පස්වරු 4.00 ට 291/2, හැව්ලොක් පාර, කොළඹ 06 හි පිහිටි රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගම ඈවර කිරීමේ කටයුතු සිදුකළ ආකාරය
2. සමාගමේ වත්කම් උපලබ්ධි කළ ආකාරය සහ
3. අදාල අනෙකුත් විස්තර ලබාදීම සම්බන්ධයෙන්

මොහොමඩ් සුහයිර් මොහොමඩ් අෂ්රොෆ්,
ඈවරකරු.

ජේබීඑස් ෂිපිං සර්විසස් ලිමිටඩ්,
38, උසාවි වීදිය, කොළඹ 12.
2022 පෙබරවාරි මස 02 වැනි දින.

02-108

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අම්බලන්තොට කොග්ගල්ල, සිංහගිරි නිවසෙහි පදිංචි මුතුහැන්නදිගේ නිමල් කිත්සිරි ද සිල්වා වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් නිශ්‍යා විජේසූරිය මහත්මිය විසින් 2009.03.29 වැනි දින ලියා සහතික කරන ලද අංක 1434 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් බලය පවරන ලද මාගේ ඇටෝර්නි බලකරු ලෙස අම්බලන්තොට, නෝනගම හි පදිංචි අරුණ ශාන්ත වීරවර්ණ යන අය පත් කිරීම 2022.01.19 වැනි දින සිට අවලංගු කර බල රහිත කළ බව සියළු දෙනාම මෙයින් දැන ගනිත්වා.

මුතුහැන්නදිගේ නිමල් කිත්සිරි ද සිල්වා,
''සිංහගිරි'' කොග්ගල්ල, අම්බලන්තොට.

02-109

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත දක්වා ඇති සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නම : ලෙසෝ හෝම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 126375
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 209/4, යුනියන් පෙදෙස, කොළඹ 02
සමාගමේ අලුත් නාමය : අයිඩීඑස්එෆ් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ජී ඩබ්ලිව් සෙක්‍රටරීස් ඇන්ඩ් එකවුන්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-110

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

දොඩන්දූව, වැලිකන්ද පදිංචි රමනි ඩේසි වන මම, 219 දින පොතේ පත්ඉරු 17/111 වෙළුම යටතේ වර්ෂ 2020.01.24 දින ලියාපදිංචි කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස දොඩන්දූව, වැලිකන්ද පදිංචි ජයසිරි අබේවීර ගුණවර්ධන යන අයගේ පත් කිරීම වර්ෂ 2022.01.28 වැනි දින සිට නීත්‍යානුකූලව අවලංගු කරන බව මෙයින් සියලු දෙනාගේ දැනගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

රමනි ඩේසි.

02-111

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

පොළොන්නරුව, කදුරුවෙල, මුස්ලිම් කොලොනිය අංක 09 හි පදිංචි මොහම්මදු රාසික් මොහම්මදු තස්ලීම් (ජා. හැ. ප. අංක 652000770 V) වන මම කුරුණෑගල, මල්ලවපිටිය, හිජ්රා මාවත, අංක 37 හි පදිංචි මොහමඩ් රාසික් සිත්ති සරීනා (ජා. හැ. ප. අංක 616193023 V) යන අය පත්කරමින් ප්‍රසිද්ධ නොතාරිස් විජය බන්ඩාර සෙනවිරත්න මහතා විසින් 2016.08.23 වැනි දින ලියා සහතික කර ලබා දෙන ලද අංක 1343 දරන ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බවත් අද පටන් එකී ඇටර්නි බලකරු වන මොහමඩ් රාසික් සිත්ති සරීනා (ජා. හැ. ප. අංක 616193023 V) යන අය විසින් කරනු ලබන කිසියම් හෝ කරුණකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

මොහම්මදු රාසික් මොහම්මදු තස්ලීම්.

02-112

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 15, මට්ටක්කුලිය, සමිත්පුර, අංක 47/එෆ්/4 දරන ස්ථානයේ පදිංචි කාටයියා සෙල්ලයියා (ජා. හැ. අංක 412781538 V) වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි ජනතාවටත් මින් දැනුම් දෙන වග නම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් කොළඹ 15, මට්ටක්කුලිය, සමිත්පුර, අංක 47/F/06 දරන ස්ථානයේ පදිංචි සෙල්ලයියා කළාවදී (ජා. හැ. අංක 197285402462) කොළඹ 15, මට්ටක්කුලිය, සමිත්පුර, අංක 47/F/06 දරන ස්ථානයේ පදිංචි ඇන්ටනී සෙබෙස්තියන් (ජා. හැ. අංක 198931900236) සහ කොළඹ 15, මට්ටක්කුලිය, සමිත්පුර අංක 47/F/4 දරන ස්ථානයේ පදිංචි සෙල්ලයියා කලාදේවි (ජා. හැ. අංක 756750984 V) යන අය පත් කරමින් දෙන ලද අංක 105 සහ 2021.12.01 වැනි දින දරන ඒ. ඩබ්. එන්. ජයවීර නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍ර පොතේ 12 වන කාණ්ඩයේ 82 වන පත්ඉරුවේ 4459 යටතේ හා 2021.12.03 දාතම යටතේ ලියාපදිංචිව ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

කාටයියා සෙල්ලයියා.

2022 ජනවාරි මස 21 වැනි දින.

02-113

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

යාපනය, මානිපායි, ඩට්ච් පාර යන ලිපිනයේ පදිංචි හැරි ඇල්ෆ්‍රඩ් ඩේවිඩ් මෝර්ගන් සහ මෝර්ගන් බිරිඳ පුෂ්පනායකි වන අප විසින් මානිපායි බටහිර, මානිපායි, යාපනය යන ලිපිනයේ පදිංචි ඉන්ද්‍රකුමාර් කබිලාෂන් යන අය වෙත ප්‍රදානය කර ඇති, ඉන්ද්‍රකුමාර් නිරූෂනන් සහ බෙනරදි බාලචන්ද්‍රන් යන අය විසින් සාක්ෂි අත්සන් තබන ලද 2017.10.18 වැනි දින දරන ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වසන්තසේනන් මහතා විසින් සහතික කරන ලද 11760 අංක දරන ඇටර්නි බලපත්‍රය 2021.11.30 දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

හැරි ඇල්ෆ්‍රඩ් ඩේවිඩ් මෝර්ගන් සහ මෝර්ගන් බිරිඳ පුෂ්පනායකි.

02-121/1

---

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

Thorn park, Mannamead, Plymouth Devon, UK, PL3 4TG ලිපිනයේ පදිංචි හැරි ඇල්ෆ්‍රඩ් ඩේවිඩ් මෝර්ගන් සහ මෝර්ගන් බිරිඳ පුෂ්පනායකි වන අප විසින් මානිපායි බටහිර, මානිපායි, යාපනය යන ලිපිනයේ පදිංචි ඉන්ද්‍රකුමාර් කබිලාෂන් සහ ඉන්ද්‍රකුමාර් නිරූෂන් යන අය වෙත ප්‍රදනය කර ඇති, 2016.08.01 වැනි දින දරන ප්‍රසිද්ධ නොතාරිස් Mr. David lan Searle මහතා විසින් සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය 2021.11.01 දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

හැරි ඇල්ෆ්‍රඩ් ඩේවිඩ් මෝර්ගන් සහ මෝර්ගන් බිරිඳ පුෂ්පනායකි.

02-121/2

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ, මොරටුව, සොයිසාපුර, මිරාජ් නිවාස යෝජනා ක්‍රමයේ, අංක 164/122 හි පදිංචි මැල්ගොඩගේ එව්ලින් (ජාතික හැඳුනුම්පත් අංකය 428261399 V) වන මා සියල්ලන්ගේ ම දැනගැනීම පිණිස දන්වා සිටින වග නම්, මා විසින් කැළණිය, පෙතියාගොඩ, මැවැල්ල පාර, අංක B 5/3 හි පදිංචි බෝපගමගේ අසේල ශ්‍යාමල් (ජාතික හැඳුනුම්පත් අංකය 700680916 V) යන අයට ලබාදී තිබූ, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් කුමුදු එස්. ජයකොඩි මහත්මිය විසින් අංක 65 දරන සහ 2018 ජූනි 11 දිනැතිව ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය මෙම දන්වීමෙහි සඳහන් දිනයේ සිට බලපවත්වන පරිදි මා විසින් අවලංගු කර නිෂ්ප්‍රභා කර බල රහිත කරන බවත්,

එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට එකී පුද්ගලයා විසින් කරනු ලබන කිසිදු කටයුත්තක් සඳහා හෝ ඇතුළුවන කිසිදු ගනුදෙනුවක් සඳහා හෝ මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මැල්ගොඩගේ එව්ලින්.

2022 ජනවාරි මස 22 වැනි දින.

02-133

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙහිවල, කළුබෝවිල, පීරිස් මාවත, ''ගීතානි'' අංක 31/A දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 563590475 V හිමි ඕමත්තගේ ප්‍රභාත් චන්ද්‍රලාල් පියරංජිත් පෙරේරා යන මා ඇටර්නි අධිපති වශයෙන් හලාවත, ආඬිගම, අලුත්ගම, දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 523040200 V හිමි ජයකොඩි ආරච්චිගේ කරුණාරත්න යන අය ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරමින් මැදපෙරදිග බහරේන් හිදී 1995 ජනවාරි මස 11 වැනි දින ලියා සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් එකී ඇටෝර්නි අධිපති වන ඕමත්තගේ ප්‍රභාත් චන්ද්‍රලාල් පියරංජිත් පෙරේරා යන අයගේ කැමැත්ත පරිදි 2021 ඔක්තෝබර් මස 20 දින පටන් අවලංගු කරනු ලබන බවත් එදිනෙන් පසු එකී ඇටර්නි බලපත්‍රයෙහි හෝ ඒ මත කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ වලංගු නොවන බවත් මෙයින් ශ්‍රී ලංකාවාසී සියලු දෙනා වෙත දන්වා සිටිමි.

ඕමත්තගේ ප්‍රභාත් චන්ද්‍රලාල් පියරංජිත් පෙරේරා.

02-134

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ ''එරික් විලා'' අංක 15, කුසල, බංගදෙනිය යන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 658451332 V දරන අර්සකුලසූරිය මේරි සුසිලා රංජනී ප්‍රනාන්දු වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 69, ලයනල් ප්‍රනාන්දු මාවත, කටුනේරිය පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 845911762 V දරන අර්සකුලසූරිය බ්‍රිජිතා සචිනි ප්‍රනාන්දු වෙත සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වයඹ හා උතුරු මැද කලාපයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර පොතේ 45 කාණ්ඩයේ 2970 පත්‍රිරුවේ 2271 දිනපොත් අංකය යටතේ වර්ෂ 2011.09.02 වැනි දින ලියාපදිංචි කර ඇති මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. එම්. ඩී. ජයසිංහ මහතා ලියා සහතික කළ වර්ෂ 2011.08.29 වැනි දින හා අංක 20547 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත නම සඳහන් අර්සකුලසූරිය බ්‍රිජිතා සචිනි ප්‍රනාන්දුට පවරා දුන් සියලු බලතල මා විසින් අවලංගු කර ඇත. මින් මතු එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය හරහා කරන ලද කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකිව යුතු නොවන බවත්, වර්ෂ 2022.01.28 වැනි දින සිට බලහත්කාරයෙන් හෝ නීතියෙන් වලංගු නොවන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් හා සියලු පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි.

අර්සකුලසූරිය මේරි සුසිලා රංජනී ප්‍රනාන්දු.

02-135

---

## ඇටර්නි බලය අහෝසි කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගොඩ, මාදුලාව දකුණ, අංක 1/21/2/11 හි පදිංචි ගල්හේනගේ අනූෂා කුමුදුනී පෙරේරා වන මම ශ්‍රී ලංකාවාසීන්ට දැනුම් දෙන වග නම්, 2017.05.03 වැනි දින මා විසින් අත්සන් කරන ලද හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දෝන නුවණි තාරිකා උදයවංශ හපුආරච්චි මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 2 සහ වර්ෂ 2017.06.01 වැනි දින අංක 8092 දරන දින පොත් අංකය යටතේ අංක 103 පත් ඉරුවේ ලියාපදිංචි කර මීගොඩ, මාදුලාව දකුණ, අංක 1/21/2 11හි පදිංචි හේවා බ්‍රාහ්මණගේ ශුශාම් දුමින්ද ජයසිංහ වෙත බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය 2021.12.12 වැනි දින සිට අවලංගු කරනු ලබන බව සියල්ලන් වෙත මෙයින් දන්වා සිටිමි.

ගල්හේනගේ අනූෂා කුමුදුනී පෙරේරා.

02-140

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

පහත නම් සඳහන් මා විසින් මයිලන්ගේ ශජිකලා දිස්නා කුමාරි පෙරේරා යන අයට ප්‍රදානය කරන ලද බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටර්නි බලපත්‍ර පොතේ 330 වෙළුමේ පිටු අංක 98 හි දින පොත් අංක 4484 හි 2021.03.23 වැනි දින ලියාපදිංචි කරන ලද ජපානයේ ටෝකියෝ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍ය සාම විනිසුරු ජී. ජී. එස්. සී. රොෂාන් විසින් ලියා අත්සන් කරන ලද 2021.03.05 දතම දරන විශේෂ ඇටර්නි බලපත්‍රය 2022.02.02 දින සිට බලපවත්වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කර අවලංගු කරන ලද බවත් මෙතැන් පටන් මෙකී ඇටර්නි බලය යටතේ ඉටු කරනු ලබන කවර හෝ ක්‍රියාවකට හෝ දෙයකට මා මින් මතු වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

කොඩිතුවක්කු ආරච්චිගේ අසංක කොඩිතුවක්කු.

2022 පෙබරවාරි මස 02 වැනි දින.

02-141

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

නුවරඑළිය කලුකැලේ අඹේපුරු අංක 15/15 දරන ලිපිනයෙහි පදිංචි ජා. හැ. අංක 713121134 වී හිමි සුජිත් විමලසූරිය වන මා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ෂිරාස් නස්රින් රාජපක්ෂ මහතා ලියා සහතික කළ අංක 1749 හා 2017.12.21 දිනැති විශේෂ ඇටර්නි බලකරය මගින් මාගේ ඇටෝර්නි බලකරු වන ඉෂාරා සෙනානි ගුණරත්න හට දී ඇති විශේෂ ඇටර්නි බලකරය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් ඇයට මින් මතු කිසිම බලයක් නොපිහිටන බවත් ශ්‍රී ලංකා ජනරජය වෙත හා ශ්‍රී ලංකාවාසී සියලු දෙනා හට මා මෙයින් ප්‍රසිද්ධ කරමි.

සුජිත් විමලසූරිය.

02-142

---

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

ගම්පොල ජයමාලපුර අංක 305/2/ඒ 03 වන පටුමග දරන ලිපිනයෙහි පදිංචි ජා. හැ. අංක 802161549 වී හිමි නමසිවායම් සත්යේන්ද්‍රන් වන මා දෝහා කටාර් තානාපති කාර්යාලයේ දී ඩී. අමානුල්ලා මහතා 2016 සැප්තැම්බර් 25 වැනි දින ලියා සහතික කල විදේශ ඇටර්නි බලපත්‍රය මගින් නමසිවායම් නලේන්ද්‍රන් හට දී ඇති විදේශ ඇටර්නි බලකරය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් ඔහුට මින් මතු කිසිම බලයක් නොපිහිටන බවත් ශ්‍රී ලංකා ජනරජය වෙත හා ශ්‍රී ලංකාවාසී සියලු දෙනා හට මා මෙයින් ප්‍රසිද්ධ කරමි.

නමසිවායම් සත්යෙන්ද්‍රන්

02-143

---

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

ගම්පොල කහටපිටිය අංක 358/1/ඒ දරන ලිපිනයෙහි පදිංචි ජා. හැ. අංක 920972403 වී හිමි මොහොමඩ් නසීර් මොහොමඩ් නවුසාන් වන මා ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් එම්. එෆ්. හුසේන් මහතා ලියා සහතික කල අංක 12415 හා 2019.11.11 දිනැති ඇටෝර්නි බලකරය මගින් මාගේ ඇටර්නි බලකරු වන මොහොමඩ් නසීර් ෆාතිමා නෆ්ලා හට දී ඇති ඇටර්නි බලකරය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් ඔහුට මින් මතු කිසිම බලයක් නොපිහිටන බවත් ශ්‍රී ලංකා ජනරජය වෙත හා ශ්‍රී ලංකාවාසී සියලු දෙනා හට මා මෙයින් ප්‍රසිද්ධ කරමි.

මොහොමඩ් නසීර් මොහොමඩ් නවුසාන්.

02-144

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

ගෙලිඔය කරමඩ විජය නිවස දරන ලිපිනයෙහි පදිංචි අංක ජා. හැ. අංක 585940879 වී හිමි විජේසිංහ මුදියන්සේලාගේ කමලා විජේසිංහ වන මා ඉතාලියේ දී ආර්. එම්. එස්. ගයනි මහත්මිය 2020 සැප්තැම්බර් මස 11 වැනි දින ලියා සහතික කල විදේශ විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් නිහාල් විජේසිංහ හට දී ඇති විදේශ විශේෂ ඇටර්නි බලකරය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් ඔහුට මින් මතු කිසිම බලයක් නොපිහිටන බවත් ශ්‍රී ලංකා ජනරජය වෙත හා ශ්‍රී ලංකාවාසී සියලු දෙනා හට මා මෙයින් ප්‍රසිද්ධ කරමි.

විජේසිංහ මුදියන්සේලාගේ කමලා විජේසිංහ.

02-145

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පීක්‍යු 131/පීබී/පීක්‍යු) සහ සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී (පීබී/පීක්‍යු 259) යෝජිත ඒකාබද්ධ කිරීම

සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී (SFL) සහ කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (CLC) හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් සම්මත කර ගන්නා ලද යෝජනාවලට ප්‍රකාරව, ඉහත සමාගම් දෙක 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 239 වන වගන්තියට අනුව ඒකාබද්ධ කිරීමෙන් කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ඒකාබද්ධිත සමාගම ලෙස පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩල වල අනුමැතිය ලැබී ඇත.

ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිවේදනය කරන ලද මූල්‍ය අංශ ඒකාබද්ධ කිරීමේ සැලැස්මට අනුව සිදු වන මෙම ඒකාබද්ධ කිරීම සිදු වනුයේ CLC හා SFL හි කොටස්කරුවන්, 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාවලට අනුකූලව යෝජිත ඒකාබද්ධ කිරීම විශේෂ යෝජනා සම්මුති මගින් අනුමත කිරීමට යටත් ව සහ ලැයිස්තුගත කිරීමේ නීති ප්‍රකාරව කෙරෙන මෙම ඒකාබද්ධ කිරීමෙන් පැන නගින CLC හි කොටස් නිකුත් කිරීම සහ ලැයිස්තුගත කිරීමට කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලැබීමට යටත්ව සහ තවදුරටත් ආරක්ෂිත ණය දෙන්නන්ගේ එකගත්වය (අදළ පරිදි) ලබා ගැනීමට යටත්වය.

මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාව ඉහත සමාගම් දෙකෙහි කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා එකී කොටස් හිමියන්ගේ විශේෂ මහා සභා රැස්වීම් කැඳවීමට බලාපොරොත්තු වන අතර එහිදී මෙම ඒකාබද්ධ කිරීම සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව විශේෂ යෝජනා සම්මතයන් මගින් අනුමත කරනු ලැබුවහොත්, මෙම ඒකාබද්ධ කිරීම, 2022 මාර්තු මස 21 වැනි දින දී බලාත්මක වේ.

ඒකාබද්ධ කිරීමේ යෝජනා වලට අනුව SFL හි කොටස් 69,666,580 ක් (සාමාන්‍ය ඡන්ද කොටස් 62,958,930 කින් සහ මනාප කොටස් 6,707,650 කින් සමන්විත) හිමිකරුවන් විසින් නිකුත් කරන ලද කොටස් වලින් 100% ක් සමන්විත වේ. SFL හි සෑම කොටස් 10,000 ක් සඳහා ම CLC හි සමාන්‍ය ඡන්ද කොටස් 7,803 (කොටස් හුවමාර අනුපාතය) ආසන්නතම කොටස වෙත වට කර ඇත. ඒ අනුව,

SFL හි කොටස් හිමියන් සතු කොටස් 69,666,580 වෙනුවට CLC හි නව සමාන්‍ය ඡන්ද කොටස් 54,360,832 ක් දක්වා SFL හි කොටස් හිමියන්ට නිකුත් කරනු ලබයි. එම නව කොටස් 54,360,832 කොටස් හිමියන්ගේ රැස්වීම සඳහා නියම කරන ලද දිනට පෙර දින වෙළඳාම අවසානයේ වෙළඳපල මිල මත නිකුත් කරන ලද මිල මත පදනම්ව නිකුත් කරනු ලැබේ. (පෙර ජේදයේ සඳහන් කර ඇති එකඟ වූ කොටස් හුවමාරු අනුපාතයට කිසිදු වෙනසක් නොමැතිව). මෙය CLC සමාගමට සහ එහි පවතින කොටස් හිමියන්ට සාධාරණ බව CLC හි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. එකී කොටස් විභජනයෙන් අනතුරුව එවකට නිකුත් කරනු ලැබූ CLC හි කොටස් වලට සම අයිතීන් සහතිව හා එම තත්ත්වයේ ම පවතිනු ඇත.

මෙම සමාගම්හි කොටස් හිමියකුට හෝ ණය හිමියෙකුට හෝ එකී සමාගමක් විසින් බැඳීමක් දරන කෙනෙකුට ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් එකී සමාගම් වල පහත දැක්වෙන ලියාපදිංචි කාර්යාලවලින් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරන වේලාවන්හි දී පරීක්ෂා කළ හැක.

සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී
කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

අංක 11, හිල් ස්ට්‍රීට් මහනුර,
අංක. 68, බෞද්ධාලෝක මාවත, කොළඹ 04

මෙම සමාගම්හි කොටස් හිමියෙකු හෝ ණය හිමියෙකු හෝ එකී සමාගමක් විසින් බැඳීමක් දරන කෙනෙකු මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ඉල්ලුවහොත් එය නොමිලේ ලබා ගත හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී

(අත්සන)
එල්ඕඑල්සී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරුන්

(අත්සන)
එච්. කේ. පී. දිල්හානි,
ලේකම්

2022 ජනවාරි මස 28

02-103

## ප්‍රසිද්ධ නිවේදනයයි

### කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පීක්‍යු 131/පීබී/පීක්‍යු) සහ එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී (පීබී 244 පීක්‍යු) යෝජිත ඒකාබද්ධ කිරීම

කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (CLC) සහ එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී (LOFC) හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් සම්මත කර ගන්නා ලද යෝජනාවලට ප්‍රකාරව, ඉහත සමාගම් දෙක, 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 239 වන වගන්තියට අනුව ඒකාබද්ධ කිරීමෙන්, එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී ඒකාබද්ධිත සමාගම ලෙස පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩල වල අනුමැතිය ලැබී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිවේදනය කරන ලද මූල්‍ය අංශ ඒකාබද්ධ කිරීමේ සැලැස්මට අනුව සිදු වන මෙම ඒකාබද්ධ කිරීම සිදු වනුයේ CLC හා LOFC හි කොටස්කරුවන්, 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව යෝජිත ඒකාබද්ධ කිරීම විශේෂ යෝජනා සම්මුති මගින් අනුමත කිරීමට යටත්ව සහ ලැයිස්තුගත කිරීමේ නීති ප්‍රකාරව කෙරෙන මෙම ඒකාබද්ධ කිරීමෙන් පැන නගින LOFC හි කොටස් නිකුත් කිරීම සහ ලැයිස්තුගත කිරීමට කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලැබීමට යටත්ව සහ තවදුරටත් ආරක්ෂිත ණය දෙන්නන්ගේ එගත්වය (අදාළ පරිදි) ලබාගැනීමට යටත්වය.

මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාව ඉහත සමාගම් දෙකෙහි කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා එකී කොටස් හිමියන්ගේ විශේෂ මහා සභා රැස්වීම් කැඳවීමට බලාපොරොත්තු වන අතර එහිදී මෙම ඒකාබද්ධ කිරීම සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව විශේෂ යෝජනා සම්මතයන් මගින් අනුමත කරනු ලැබුවහොත්, මෙම ඒකාබද්ධ කිරීම, 2022 මාර්තු මස 31 වැනි දිනයට බලාත්මක වේ.

ඒකාබද්ධ කිරීමේ යෝජනාවට අනුව, CLC හි නිකුත් කරන ලද කොටස් වලින් 100%ක සමන්විතයක් වන 6,432,072,002 කොටස් ප්‍රමාණයක [CLC සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සමග ඒකාබද්ධ කිරීමෙන් පසු කොටස් ගණන] හිමියන්, LOFC හි කොටස් හිමිකර ගනී. ප්‍රතිපාදන අනුපාතය කොටස් හිමියන්ගේ රැස්වීම් දෙකට ම නියමිත දිනට පෙර වෙළඳපල දින පහක් (5) වෙළඳාම අවසන් වන විට CLC සහ LOFC හි කොටසක වෙළඳපල මිල මත පදනම් වේ.

ඉහත සඳහන් කළ විනිමය වටිනාකම මත පදනම්ව CLC හි කොටස් හිමියන්ට LOFC හි නිකුත් කළ යුතු කොටස් ආසන්නතම කොටස වෙත වට කරනු ලැබේ.

ඒ අනුව, LOFC විසින් නිකුත් කරනු ලබන කොටස් සංඛ්‍යාව මෙහි 4 වන ඡේදයේ දක්වා ඇති නිර්ණායක මත රඳා පවතී.

කැපිටල් ට්‍රස්ට් පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් නිකුත් කරන ලද 2022 ජනවාරි මස 21 දිනැති තක්සේරු වාර්තාවට අනුව, CLC හි කොටසක වටිනාකම් පරාසය (සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සහ CLC අතර ඒකාබද්ධ කිරීමට පෙර කොටස් සංඛ්‍යාව මත පදනම්ව) ඒකාබද්ධ කිරීමේ අරමුණ වෙනුවෙන් රු. 10.40 - 39.30 වශයෙන් සහ LOFC කොටස් සම්බන්ධයෙන් රු. 11.33 - 39.90 වශයෙන් සඳහන් වේ. CLC පශ්චාත් ඒකාබද්ධ කිරීමේ කොටස් සංඛ්‍යාව 6,377,711,170 සිට 6,432,072,002 (ආසන්න වශයෙන් කොටස් 54,360,832) දක්වා වැඩි වනු ඇත. දැනට පවතින SFL කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ප්‍රතිශතය 0.85% වන අතර පවතින CLC කොටස් හිමියන්ට ආරෝපණය කළහැකි ප්‍රතිශතය 99.15% වේ.

තක්සේරු වාර්තාවේ CLC හි සාමාන්‍ය කොසක මිල පරාසයට, CLC සහ SFL අතර ඒකාබද්ධතාවයෙන් පැන නගින බලපෑම සැලකිල්ලට ගෙන නොමැත. SFL සහ CLC ඒකාබද්ධතාවයෙන් පැන නගින ශුද්ධ මූල්‍ය බලපෑම සමාගමේ කළමනාකාරිත්වය විසින් තවමත් ප්‍රමාණනය කර නැත. එම ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී. 2021 සැප්තැම්බර් මස 30 වැනි දිනට අන්තර්වාර මූල්‍ය ප්‍රමාණයට අනුව SFL හි මුළු කොටස් ප්‍රමාණය ආසන්න වශයෙන් CLC හි මුළු කොටස් ප්‍රමාණය 3.52% ක් පමණක් බව සටහන් කළ යුතු අතර, එබැවින් කැපිටල් ට්‍රස්ට් පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් CLC සහ SFL ඒකාබද්ධ කිරීමෙන් මෙම වාර්තාවේ පිළිබිඹු වන CLC මිල පරාසයට වන බලපෑම් සැලකිල්ලට ගෙන නොමැත.

තව දුරටත් ඒකාබද්ධ කිරීමේ අරමුණ සඳහා/කොටස් හුවමාරු අනුපාතයේ වටිනාකම, කොටස් හිමියන්ගේ රැස්වීම් දෙකට ම නියමිත දිනට වෙළඳපල දින පහක් (5) කට පෙර වෙළඳාම අවසන් වන විට CLC සහ LOFC හි කොටසක වෙළඳපල මිල මත පදනම් විය යුතු ය. විනිමය වටිනාකම මත පදනම්ව CLC හි කොටස් හිමියන්ට LOFC හි නිකුත් කළ යුතු කොටස් ආසන්නතම කොටස වෙත වට කරනු ලැබේ. එම ක්‍රමය දැනට සිටින LOFC කොටස් හිමියන් වෙනුවෙන් සාධාරණ පදනමක් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

මෙම සමාගම්හි කොටස් හිමියකුට හෝ ණය හිමියෙකුට හෝ එකී සමාගමක් විසින් බැඳීමක් දරන කෙනෙකුට ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් එකී සමාගම් වල පහත දැක්වෙන ලියාපදිංචි කාර්යාලවලින් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරන වේලාවන්හි දී පරීක්ෂා කළ හැක.

| | |
|---|---|
| කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | අංක. 68, බෞද්ධාලෝක මාවත, කොළඹ 04 |
| එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී | අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය. |

මෙම සමාගම්හි කොටස් හිමියෙකු හෝ ණය හිමියෙකු හෝ එකී සමාගමක් විසින් බැඳීමක් දරන කෙනෙකු මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ඉල්ලුවහොත් එය නොමිලේ ලබා ගත හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී

(අත්සන)
එල්ඕඑල්සී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරුන්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

(අත්සන)
එල්ඕඑල්සී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරුන්

2022 ජනවාරි මස 28

02-104

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඉසුරුසිරි මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0057 1000 4511.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.09.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි තිස් අට ලක්ෂ හැත්තෑ හතර දහස් අටසිය අසූ එකයි ශත විසි නමයක (රු. 13,874,881.29) මුදල ද, 2019 අගෝස්තු මස 31 වැනි දින සිට අංක 1825 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි තිස් දෙලක්ෂ හතළිස් නම දහස් හයසිය හතළිස් එකයි ශත අනූ අටක (රු. 13,249,641.98) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.11.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2019.10.25 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.03.18 වැනි දින පෙ. ව. 11.30 ට** පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ඉංගිරිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වගවත්ත, අංක 618 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කළුපහන ග්‍රාමයේ පිහිටි "බෙරවාගොඩ" යයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන එම්. ආර්. ගිනිගේ යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් මස 04 දාතම හා අංක 2135 දරන පිඹුරේ ලොට් 1 හි නැවත මිනුමක් වන තවත් අයුරකින් බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. ඩී. චන්ද්‍රාණි යන අය විසින් සාදන ලද 2004 අප්‍රේල් මස 24 දාතම හා අංක 700 දරන පිඹුරේ ලොට් 1 හි නැවත මිනුමක් ද එමෙන්ම බලයලත් මානක තැන ජේ. ඕ. ඕර් යන අය විසින් සාදන ලද 1943 අගෝස්තු මස 27 දාතම හා අංක 3273 දරන පිඹුරේ ලොට් 3 සහ 7 හි ඒකාබද්ධයක් ද වන) බලයලත් මානක තැන එම්. ආර්. ගිනිගේ යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් මස 04 දාතම හා අංක 2135A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : බලයලත් මානක තැන එම්. ආර්. ගිනිගේ යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් මස 04 දාතම හා අංක 2135 දරන පිඹුරේ ලොට් 2, මෙහි ලොට් 1B සහ බලයලත් මානක තැන ජේ. ඕ. ඕර් යන අය විසින් සාදන ලද අංක 3273 දරන පිඹුරේ ලොට් 5 සහ 8, දකුණට : අංක 3273 දරන පිඹුරේ ලොට් 5 සහ 8 සහ පිට ඇළ සහ බස්නාහිරට : අංක 3273 දරන පිඹුරේ ලොට් 6 සහ 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහ අටයි දශම අටයි බිංදුවක් (A: 1, R: 2, P: 18.80) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2135A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව M 15/124 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02-60

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එස්. පී. ඒකනායක.
ගිණුම් අංක : 0179 5000 2158.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.12.16 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා

සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැත්තෑ හත්ලක්ෂ තුන් දහස් හත්සිය හැත්තෑ නමයයි ශත විසි පහක (රු. 17,703,779.25) මුදල ද, 2020 දෙසැම්බර් 01 දින සිට අංක 3923 සහ 4519 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් එක්කෝටි පනස් දෙලක්ෂ අසූඑක් දහස් අටසිය හැට හතයි ශත පනහක (රු. 15,281,867.50) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.04.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2021.03.24 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.03.25 වැනි දින පෙ. ව. 11.00 සිට** පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4A සහ 4C හි උපබෙදුම'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 4F වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 3, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 4B (පාර), දකුණට : මෙම ඉඩමේ ලොට් 4B (පාර) සහ මෙම ඉඩමේ ලොට් 4G, බස්නාහිරට : අලුත්දෙණිය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම තුනයි හතරක් (අ. 0, රූ. 0, පර්. 10.34) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී පිඹුරට අනුව යොමුව P110/23 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4A සහ 4C හි උපබෙදුම '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 4 G වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4F , නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 4 B (පාර), දකුණට : මෙම ඉඩමේ ලොට් 4 H, බස්නාහිරට : අලුත්දෙණිය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී පිඹුරට අනුව යොමුව P110/24 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම් ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405 D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4 A සහ 4 C හි උපබෙදුම '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 4 H වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4G , නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 4B (පාර), දකුණට : මෙම ඉඩමේ ලොට් 4I , බස්නාහිරට : අලුත්දෙණිය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී පිඹුරට අනුව යොමුව P110/25 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

4. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය සභා ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4 A සහ 4 C හි උපබෙදුම '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 4I වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4 H, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 4 B (පාර), දකුණට : මෙම ඉඩමේ ලොට් 4 J, බස්නාහිරට : අලුත්දෙණිය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී

පිඹුරට අනුව යොමුව P110/26 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

5. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4 A සහ 4 C හි උපබෙදුම '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 4 J වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4 I , නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 4 B (පාර), දකුණට : මෙම ඉඩමේ ලොට් 4K බස්නාහිරට : අලුත්දෙණිය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී පිඹුරට අනුව යොමුව P 110/27 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

6. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4A සහ 4C හි උපබෙදුම '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 4 M වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4B, (පාර) සහ ක්‍රෙග්හෝල් වත්ත නොහොත් ග්‍රෙග්හෝල් වත්ත, නැගෙනහිරට : ක්‍රෙග්හෝල් වත්ත නොහොත් ග්‍රෙග්හෝල් වත්ත, දකුණට : මෙම ඉඩමේ ලොට් 4 N, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 4B (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙළහයි දශම නමයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 12.93) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී පිඹුරට අනුව යොමුව P110/28 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

7. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4 A සහ 4 C හි උපබෙදුම '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්.ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 4N වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4M, නැගෙනහිරට : ක්‍රෙග්හෝල් වත්ත නොහොත් ග්‍රෙග්හෝල් වත්ත, දකුණට : මෙම ඉඩමේ ලොට් 4 O, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 4B (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී පිඹුරට අනුව යොමුව P110/29 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

8. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4 A සහ 4 C හි උපබෙදුම '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 4 O වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4N , නැගෙනහිරට : ක්‍රෙග්හෝල් වත්ත නොහොත් ග්‍රෙග්හෝල් වත්ත, දකුණට : මෙම ඉඩමේ ලොට් 4 P, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 4B (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී පිඹුරට අනුව යොමුව P110/30 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

9. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේන්වල - බටහිර 405D ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිරිස්ස පිහිටි ''ගල්කඩුවේහේන හි ලොට් A සහ B හි ලොට් 4 හි ඒකාබද්ධ ලොට් 4 A සහ 4 C හි උපබෙදුම '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. සේනාරත්න යන අය විසින් සාදන ලද 2014.03.05 දතම හා අංක 2160 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 4 P වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 4O සහ ක්‍රෙග්හෝල් වත්ත නොහොත් ග්‍රෙග්හෝල් වත්ත, නැගෙනහිරට : ක්‍රෙග්හෝල් වත්ත නොහොත් ග්‍රෙග්හෝල් වත්ත සහ අලුත්දෙණිය දකුණට : මෙම ඉඩමේ ලොට් 4D, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 4 B (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි පහක් (අ. 0, රූ. 1, පර්. 25) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ මුළුමනින්ම ද සමග අංක 2160 දරන එකී පිඹුරට අනුව යොමුව P110/31 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2160 දරන එකී පිඹුරේ දක්වා ඇති ලොට් 4B සහ ලොට් 5 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම දිගේ ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02-61

HNB 50 - 2020

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මාතර ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි මාතර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද අංක 68 සහ 2015.04.01 වැනි දින දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම එම්/එස්/කැට්වෝක් හි තනි අයිතිකරු වන කන්කානම් ගමගේ එරික් ජානක ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ අය විය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ **2022 ක් වූ මාර්තු මස 07 වැනි දින ප. ව. 12.30** ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ පළාත් පාලන අධිකාරිය තුළ කඩවීදිය දකුණ 417 බී ග්‍රාම නිලධාරී වසම තුළ කඩවීදියෙහි පිහිටි කුමාරතුංග මාවත සහ වරිපනම් අංක 61 (පැරණි අංකය 845) දරන කඳුබොඩපත්තුවේ වලව්ව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රස්මි විසින් සාදන ලද අංක 3097 ඒ හා 2008 නොවැම්බර් මස 10 වැනි දින දරන මානක පිඹුරේ දක්වෙන ලොට් ඒ 2 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද පර්චස් දහ හතයි දශම පහයි තුන (අ. 0, රූ. 0, පර්. 17.53) ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ එහි ඇති සෑම සියළු දේ ද වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2020.02.28 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2020.03.10 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - මාතර බස් නැවතුම් පොල සිට පරණ ගාලු පාරේ දූන් කුමාරතුංග මුනිදාස මාවතේ සැතපුම් 1/4ක් පමණ ගිය පසු ශාන්ත තෝමස් කනිෂ්ඨ විද්‍යාලය දක්වා ගිය පසු අදාල දේපලට ලගා විය හැක. එම පාරේ වම් අත පැත්තේ අදාල දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ක් ද,
6. සියළුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදළ ලේඛණ පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අමතන්න. දුරකථන අංක 011- 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දොඩන්දූව.
දුරකථන අංක : 071 3358434, 0779 - 663420
Email : ejayawardhana77@gmail.com

02-72

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - පිළියන්දල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 5342 හා 2016.08.16 දින දරන සහ අංක 5861 හා 2018.01.17 දින දරන සහ අංක 6222 හා 2019.02.15 දින දරන උකස් බැඳුම්කර මත ගෙවිය යුතු මුදල් ගෙවීම ණයකරු

වශයෙන් මැප්ස් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති අතර ඒ අනුව එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල් සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපළ,

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2022 මාර්තු මස 3 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ උඩුගහ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ හෝමාගම ප්‍රාදේශීය සභාවේ වැතර උප කාර්යාල සීමාව තුළ 599 පාලගම ග්‍රාම නිලධාරී වසම තුළ පාලගම ගමේ පිහිටි නාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සිරි බෝපේ ආරච්චි විසින් සාදන ලද අංක 3405 සහ 2002 අප්‍රේල් මස 06 දින දරන පිඹුරේ ලොට් 1 දරන ඉඩම ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් දෙළහයි දශම එකයි දෙකක් (අ. 1, රූ. 1, පර්. 12.12) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා.- 2021.05.07 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2022.01.06 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ සිට හයිලේවල් පාර (ඒ 4 ට්‍රන්ක් පාර) ඔස්සේ කිරුලපන පාලම තෙක් ගමන් කොට දකුණට හැරී ස්ටැෆර්ඩ් මාවත පිවිස කිලෝමීටර් 0.6 ගමන්කොට පාමංකඩ පාලම දක්වා පැමිණ ඉන්පසු හොරණ දක්වා ඇති මාර්ගය (බී 84 ට්‍රන්ක් මාර්ගය) ඔස්සේ ගමන් කරමින් කොහුවල, බොරලැස්ගමුව, පිළියන්දල යන නගර පසු කොට කැස්බෑව නගරය තෙක් කිලෝමීටර් 21ක් ගමන් කරන්න. ඉන්පසු හොරණ දෙසට තවත් කිලෝමීටර් 05ක් එම මාර්ගයේ ම 19 වන කිලෝමීටර් කණුව (කිලෝමීටර් කණුව පාමංකඩ පාලමේ සිට ලකුණු කර ඇත) හමුවන තෙක් කහතුඩුව හංදිය දක්වා ගමන් ගෙන එම මාර්ගයේ ම තවත් මීටර් 100ක් ගමන් කර දකුණු පසට හැරී පරණ පාරට පිවිස තවත් මීටර් 50ක් ගමන් කොට දකුණට හැරී දියකඩ පාරට පිවිස ජැට් හෝල්ඩින් කර්මාන්ත ශාලා භූමිය සහ දක්ෂිණ අධිවේගී මාර්ගය පසු කරමින් දියකඩ හංදිය තෙක් කිලෝමීටර් 02ක් ඉන්පසු දකුණට හැරී පොල්ගස්ඕවිට පාර ඔස්සේ හංදිය දක්වා කිලෝමීටරයක් පමණ හංදියට දකුණු පසින් පිහිටා ඇති ඇල්පා කර්මාන්ත ශාලා භූමිය දිස් වන තෙක් ගමන් කරන්න. එම ස්ථානයේ සිට වමට හැරී කිඳෙල්පිටිය පාර පිවිස පාරේ වම් පසින් පිහිටා ඇති වයි ඒ වීරසිංහ අනුස්මරණ බස් නැවතුම්පල හමුවන තෙක් පාලගම හංදිය ඔස්සේ කිලෝ මීටර් 1.1ක් දුරක් ගමන් කරන්න. මෙම දේපල ඉහත කී බස් නැවතුම්පොලට විරුද්ධ පැත්තේ ප්‍රධාන පාරට මුහුණ ලා හංදියේ ස්ථාපනය කර ඇති ට්‍රාන්ස්ෆෝමරයට යාබදව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

(01) ගැණුම් මිලෙන් (10%) ක් ද,
(02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් ද,
(04) ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
(05) විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
(06) විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් (90%) වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10. ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 011- 2661866, 011- 2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011- 2053286/072 3207533
076 9217329.

02-77

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

හෝමාගම දිසා අධිකරණයේ දී ය.

හෝමාගම හයිලෙවල් පාරේ, අංක 100 දරණ ස්ථානයේ හෝමාගම ශාඛාව යනුවෙන් හැඳින්වෙන සහ සඳහන් කරනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ කොළඹ 01, ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවතේ, අංක 21 දරණ ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

නඩු අංකය : 15066/MB
ස්වභාවය: උකස්කරය

.................*පැමිණිලිකරු.*

*එදිරිව*

දැදිගමුව, පනාගොඩ, සිදුහත් මාවතේ, අංක 333/2 දරණ ස්ථානයේ තලගලගේ දොන් ලක්සිරි තලගල

.........................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2018ක්වූ මාර්තු මස 22 දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට රු. 1,414,084.91ක මුදලක් සහ රු. 562,653.83ක මුදලක් යනුවෙන් එකතුව රු. 1,976,738.74ක් වන්නා වූ මුදලක් සහ එකී රු. 1,414,084.91ක් වන්නා වූ මුදල මත 2013 ඔක්තෝබර් මස 01 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 18.5% බැගින් වැඩිදුර පොළිය ද ගෙවිය යුතු බවට ද ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට අධිකරණයේ නිලධාරියෙකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන නඩු ගාස්තුද ගෙවිය යුතු බවට ද,

තවද තීන්දු ප්‍රකාශයේ සහ මෙහි වූ උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එකී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කළ හැකි බවට ද නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2018ක් වූ මාර්තු මස 22 වන දින හෝමාගම දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ, එම දේපළ පිහිටි ස්ථානයේ දී, වර්ෂ 2022ක්වූ මාර්තු මස 04 වන දින පෙ.ව 11.30ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත, උතුරු පිටිපන පිහිටි මොරගහහේන පාරේ, වරිපනම් අංක 99/2 දරණ කිරිබේරියකැලේවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු තැන්පත් පී. කේ. සුමනදාස විසින් මැන සාදන ලද අංක 76/4837 සහ 2007 ජූලි මස 11 වැනි දින දරන සැලැස්මේ නිරූපිත අංක 1A/1 බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති එම සම්පූර්ණ බිම් කැබැල්ල එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියල්ල සහිතවයි. හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත් ඉරුව G 1267/111 හි ලියාපදිංචි කර ඇති එකී අංක 76/4837 දරණ සැලැස්ම අනුව එකී අංක 1 A/1 බිම් කැබැල්ලට මායිම් උතුරට: ඩබ්ලිව්. ඒ. සේනාරත්නගේ සහ අනිත් අයගේ කිරිබේරියකැලේවත්ත, නැගෙනහිරට: අංක 76/2563 දරන සැලැස්මේ (වරිපනම් අංක 4/543 දරණ) අංක 1B බිම් කැබැල්ල දකුණට : ප්‍රාදේශීය සභා පාර (මීටර් 6ක් පළලයි) බස්නාහිරට: අංක 76/ 2563 දරණ සැලැස්මේ අංක 1A බිම් කැබැල්ලේ ඉතිරි කොටස සහ එහි ප්‍රමාණය පර්චස් දහයක් (අ:0 රූ:0 පර්: 10) හෙවත් හෙක්ටයාර් 0.0253ක් වේ.

*ඉඩමට පිවිසීම.-* කොළඹ සිට හෝමාගම නගරයට පැමිණ කිරිවත්තුඩුව පාරේ මීටර් කිහිපයක් ගමන් කළ විට කිරිබේරියකැලේ හංදිය හමුවේ. එම හන්දියෙන් වමට ඇති කොන්ක්‍රීට් පාරේ මීටර් 60ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ වන වරිපනම් අංක 543/5A එම පාරේ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් ගෙවිය යුතුය.
02. නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව රු. 10,500/-
03. සියළුම ප්‍රචාරක වියදම්
04. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු සියයට දෙකයි දශම පහයි (2.5% )
05. රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු
06. ලිපිකරු, සෝෂක සහ බෙරකරු ගාස්තුව රු. 4,500/-
07. ගැනුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) දින 30ක් ඇතුලත දී හෝමාගම දිසා අධිකරණයේ ඉහත සඳහන් ගිණුමට තැන්පත් කළ යුතුය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥ සහ නොතාරිස්වරු
අංක 810, 02 වන මහල,
මරදාන පාර, කොළඹ 10.
දුරකථන : 0112 672262
0112 672263

අරච්චාවල සුසිලා කුමාරි
තක්සේරුකරු, වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්
සහ සාම විනිසුරු (මුළු දිවයිනටම)

අංක 109/21, පෙලෙන්ගස්තුඩුව පාර,
බොරැල්ල.
දුරකථන : 0763 619284
0112 671140

02 -73

**වෙන්දේසියේ විකිණීමයි.**

**හෝමාගම දිසා අධිකරණයේ දී ය.**

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අංක 21, ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත, කොළඹ 01 සහ හෝමාගම හයිලෙවල් පාරේ, අංක 100 දරන ස්ථානයේ හෝමාගම ශාඛාව යනුවෙන් සඳහන් කරනු හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාර ස්ථානයක් ඇත්තේය.

නඩු අංකය : 0091/16/MB

ස්වභාවය : උකස්කරය

......................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. තලගලගේ දෙන් ලක්සිරි තලගල
02. සිතාරි සජීවනී නිසංසලා කොඩිකාර

දෙදෙනාම

අංක 333/2, සිදුහත් මාවත,
පනාගොඩ, දූඩිගමුව

....................*විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2019 ක්වූ ජුනි මස 04 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට රු. 1,140,000/- ක් සහ රු. 752,286.25 ක් ලෙස සමස්ථය රු. 1,892,286.25 ක් සහ රු. 1,140,000/- ක් වූ එකී මුදල මත 2015 දෙසැම්බර් මස 17 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් වර්ෂයකට 14% ක වැඩිදුර පොලියක් ද සමග ගෙවිය යුතු බවට ද,

තවද රු. 202,500/- ක මුදලක් සහ එකී මුදල මත පැමිණිල්ලේ දිනයේ සිට නෛතික පොලිය ද ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශිත මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් ඒ මුදල මත වැඩිදුර නෛතික පොලිය ද ගෙවිය යුතු බවට ද,

රු. 825,000 ක මුදලක් සහ රු. 825,000 ක් වූ එකී මුදල මත 2015 දෙසැම්බර් මස 17 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂයකට 23% ක වැඩිදුර පොලිය ද සමඟ ගෙවිය යුතු බවට ද,

ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට මෙම නඩුවේ තක්සේරු නඩු ගාස්තු ගෙවිය යුතු බවට ද,

තවද තීන්දු ප්‍රකාශයේ සහ මෙහි පළමු සහ දෙවන උපලේඛනයන්හි විස්තර කර ඇති ඉඩම් ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බැදී පවතින බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට ද නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2019 ක් වූ ජුනි මස 04 වැනි දින හෝමාගම දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනවල සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානවලදී,

***01 වැනි උපලේඛනය.-***
වර්ෂ 2022 ක්වූ මාර්තු මස 04 වැනි දින පෙ.ව. 10.30 ටද,

***02 වැනි උපලේඛනය-***
වර්ෂ 2022 ක්වූ මාර්තු මස 04 වැනි දින පෙ.ව. 11.30 ටද, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වටරැක

ග්‍රාමයේ පිහිටා ඇත්තා වූද, උතුරින් : අංක 67 හා ඩී3 බිම් කැබලිවලින් නැගෙනහිරින් : ඩී3 හා අංක 69 බිම් කැබලිවලින් දකුණින් : අංක 69 හා ආර්. 1 බිම් කැබලිවලින් සහ බස්නාහිරින් : ආර් 1 හා 67 බිම් කැබලි වලින් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද අංක 2003/258 හා 2003 සැප්තැම්බර් මස 23 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයකින් (අ:0, රූ:0 පර්:10) නැතහොත් හෙක්ටයාර් 0.0253 කින් යුක්ත වූ ද, අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 277/201 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "බ්ලැක් පර්ල් එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2003/258 දරන පිඹුරේ නිරූපිත අංක 68 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේද සමග වේ.

ඒ ඉඩම් කැබැල්ලට පහත විස්තර කරනු ලබන පාරක් සඳහා වෙන් කරන ලද බිම් කැබැලි මතුපිටින් හා ඒ ඔස්සේ මාර්ග අයිතියද සමග වේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ මැදපත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වටරැක ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද අංක 2003/258 හා 2003 සැප්තැම්බර් මස 23 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස්හතරයි දශම හතයි අටකින් (අ:0 රූ:0 පර්:34.78) නැතහොත් හෙක්ටයාර් 0.1891 කින් යුක්ත වූ ද අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 277/202 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූද බ්ලැක් පර්ල් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2003/238 දරන පිඹුරේ නිරූපිත ආර් 1 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (පාරක් සඳහා වෙන්කරන ලද බිම් කැබැල්ල) බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ මැද පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වටරැක ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද අංක 2003/258 සහ 2003 සැප්තැම්බර් මස 23 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් විසිහතරයි දශම දෙකයි හතරකින් (අ:0 රූ:0 පර්:24.24) නැතහොත් හෙක්ටයාර් 0.0613 කින් යුක්ත වූද අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 277/203 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බ්ලැක් පර්ල් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2003/258 දරන පිඹුරේ නිරූපිත ආර් 10 වශයෙන් සලකුණු කරන ලද (පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල) බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වටරැක ග්‍රාමයේ පිහිටා ඇත්තාවූද, බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද අංක 2003/258 හා 2003 සැප්තැම්බර් මස 23 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හයයි බිංදුවකින් (අ:0 රූ:0 පර්:4.60) නැතහොත් හෙක්ටයාර් 0.0116 කින් යුක්ත වූද අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාර්යාලයේ එන් 277/204 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, බ්ලැක් පර්ල් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2003/258 දරන පිඹුරේ නිරූපිත ආර් 6 වශයෙන් සලකුණු කරන ලද (පාරක් සඳහා වෙන්කරන ලද ඉඩම් කැබැල්ල) බෙද වෙන් කරන ලද හා නිශ්චිතත මුළු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ මැද පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වටරැක ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද අංක 2003/258 හා 2003 සැප්තැම්බර් මස 23 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දෙකකින් (අ:0 රූ:0 පර්:02) නැතහොත් හෙක්ටයාර් 0.3085 කින් යුක්ත වූද අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාර්යාලයේ එන් 277/205 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූද, බ්ලැක් පර්ල් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2003/258 දරන පිඹුරේ නිරූපිත ආර් 13 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (පොදු ප්‍රදේශයක වශයෙන් වෙන් කර ඇති) බෙදා වෙන් කරන ලද හා නිශ්චිතත මුළු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වටරැක ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද අංක 2003/258 හා 2003 සැප්තැම්බර් මස 23 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බින්දුවයි හතකින් (අ:0 රූ:0 පර්:6.07) නැතහොත් හෙක්ටයාර් 0.0153 කින් යුක්ත වූද, අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 277/206 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූද, බ්ලැක් පර්ල් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2003/258 දරන පිඹුරේ නිරූපිත ඩී 3 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (කාණුවක් සඳහා වෙන් කරන ලද බිම් කැබැල්ල) බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ. මේ ඉඩම් කැබැල්ලට ජල ටැංකියක් සඳහා වෙන් කරන ලද ආර් 13, ආර් 7, ආර් 8 බිම් කැබලි සහ ළිඳක් සඳහා වෙන් කරන ලද අංක 54 හා 106 බිම් කැබලි මතුපිටින් හා ඒ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිටිපන

උතුර පිහිටා ඇත්තා වූද, මොරගහහේන පාරේ වරිපනම් අංක 99/2 දරන්නාවූද, උතුරින්: ඩබ්ලිව්. ඒ. සේනාරත්නට හා වෙනත් තැනැත්තන්ට අයත් කිරිබේරියකැලේ වත්තෙන් නැගෙනහිරින්: අංක 76/2563 දරන පිඹුරේ 1 බී බිම් කැබැල්ලෙන් (වරිපනම් අංක 4/543 දරන) දකුණින්: ප්‍රාදේශීය සභා පාරෙන් (මීටර් 6 ක් පළල ඇති) සහ සහ බස්නාහිරින්: අංක 76/2563 දරන පිඹුරේ 1ඒ බිම් කැබැල්ලේ ඉතිරි කොටසින් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු පී. කේ. සුමනදාස විසින් සාදන ලද අංක 76/4837 හා 2000 ජූලි මස 11 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයකින් (අ:0 රූ:0 පර්:10) නැතහොත් හෙක්ටයාර් 0.0253 කින් යුක්ත වූද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1267/111 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, කිරිබේරියකැලේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 76/4837 දරන පිඹුරේ 1ඒ/1 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

*ඉඩම්වලට පිවිසීමට.-*

**01 වැනි උපලේඛනය**

කොළඹ සිට ගොඩගම හංදියට පැමිණ එම හන්දියෙන් පාදුක්ක පාරේ කිලෝමීටරයක් පමණ ගමන් කළ විට කොස්හේන රුසිරුමල් ඇඟලුම් කර්මාන්ත ශාලාව හමුවේ. එතැනින් දකුණට ඇති බ්ලැක් පර්ල් එස්ටේට් එකට වෙන්කර ඇති අඩි 20 ක් පමණ පළල පාරේ මීටර් 100 ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ වන වරිපනම් අංක 41/B/69 පාරේ වම්පසින් පිහිටා ඇත.

**02 වැනි උපලේඛනය**

කොළඹ සිට හෝමාගම නගරයට පැමිණ කිරිවත්තුඩුව පාරේ මීටර් කිහිපයක් ගමන් කළ විට කිරිබේරියකැලේ හංදිය හමුවේ. එම හංදියෙන් වමට ඇති කොන්ක්‍රීට් පාරේ මීටර් 60 ක් පමණ ගමන් කළ විට අදාළ දේපල වන වරිපනම් අංක 543/5ඒ එම පාරේ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%)ක් ගෙවිය යුතුය,
2. නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව රු. 10,500/-
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු සියයට දෙකයි දශම පහයි (2.5%),
5. රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු,
6. ලිපිකරු, සෝෂක සහ බෙරකරු ගාස්තුව රු. 4,500/-
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) දින 30 ක් ඇතුළත දී හෝමාගම දිසා අධිකරණයේ ඉහත සඳහන් ගිණුමට තැන්පත් කළ යුතුය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥ සහ නොතාරිස්වරු,
අංක 810, 02 වන මහල,
මරදාන පාර, කොළඹ 10,
දුරකථන : 0112 672262
0112 672263

අරව්වාවල සුසිලා කුමාරි,
තක්සේරුකරු, වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්,
සහ සාම විනිසුරු (මුළු දිවයිනටම).

අංක 109/21, පෙලෙන්ගස්තුඩුව පාර,
බොරැල්ල.
දුරකථන : 076 3619284/ 0112 2671140.

02-74

---

**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව අරුමුගම් රාමලිංගම් බෝකලවල ගෙදර මාලනි රම්‍යලතා සහ පරමසිවම් සාල්ෂාන් යන අය ණයකරුවන් වශයෙන් සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් බුද්ධික එස්. රණසිංහ විසින් ලියා සහතික කරන ලද 2019.01.24 දිනැති අංක 311 දරන බැඳුම්කරය මගින් සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. බැංකුවට උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ **2022 ක් වූ මාර්තු මස 10 වැනි දින ප. ව. 3.00** ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

*දේපල විස්තරය.* - මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ නගර සභා සීමාවන් තුළ ඔය පහල ග්‍රාම නිලධාරි වසම හි ඔය පහල ගමේ පිහිටි හේනේගෙදර කුඹුර නොහොත් ගොඩවෙල වත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ වී සිරිසුමන විසින් 2006.08.25 වැනි දින මැන සාදන ලද අංක 7108 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ

ලොට් 01 සහ ලොට් 02 දරන ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගහකොළ වගාව කොඩනැගිලි ඇතුලු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : ලොට් 01, පර්. 08, ලොට් 02 පර්. 7.25 මුළු ප්‍රමාණය පර්චස්. 15.25)

ඉහත කී පිඹුරේ නිරූපිත ලොට් අංක 03 දරන අඩි 10ක් පළල මාර්ග ප්‍රවේශය පාවිච්චි කිරීමේ සම්පූර්ණ අයිතිය ද සමගින් ද වේ.

*දේපලට පිවිසීම.* - මාතලේ නගරයේ නුග ගහ බස්නැවතුම් පොළ අසළ සිට ත්‍රිකුණාමලය වීදිය ඔස්සේ ප්‍රධාන තැපැල් කන්තෝරුව දෙසට මීටර් 400ක් පමණ ගමන් ගෙන හැරිසන් ජෝන් පාර හන්දියෙන් දකුණට හැරී හැරිසන් ජෝන් පාරට පිවිස එම පාර ඔස්සේ මීටර් 700 ක් පමණ ගමන් ගෙන දකුණට පිහිටි අඩි 10ක් පමණ පළල පාරට හැරී මීටර් 100ක් පමණ ගමන් ගත් පසු ආදළ දේපල පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.04.23 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2021.04.23 වැනි දින මව්බිම දි අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රුපියල් 3,000.00

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : අංශ ප්‍රධානි (ණය අයකිරීම් සහ එකතු කිරීම්) සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපොන, කොළඹ 06.

දුරකථන අංක : 011- 283 2500.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන ජංගම : 071 4 962 449/071 8 446 374

02-124

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ කටුනායක පීල්ලවත්ත ගැමුණු මාවත අංක 170 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ටැක්සි. එල්කේ ග්ලොබල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (Taxi.lk Global (Private) Limited) බන්ධනදායි වශයෙන් හා දිසානායක මුදියන්සේලාගේ ප්‍රියල් සුනෙත් දිසානායක යන අය උකස්කරු වශයෙන් ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තරවන දේපල

එම දේපල පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***1 වැනි විකිණීම.* - 2022 ක්වූ මාර්තු මස 10 වැනි දින පෙ. ව. 11.00 ට**

*දේපල විස්තරය.* - මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වග පනහ පල්ලේසිය පත්තු මාතලේ උතුර කොට්ඨාසයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ලෙනදොර උතුරු ග්‍රාම නිලධාරී වසම ලෙනදොර ගමේ පිහිටි හකිරිල්ල සහ මැදයාය නමැති ඉඩමට බලයලත් මානක ඒ. ජේ. බණ්ඩාර විසින් 2013 අගෝස්තු මස 10 වැනි දින මැන සාදන ලද අංක 5533 දරන පිඹුරේ සඳහන් ලොට් 03 නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුලු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය අක්. 01, රූඩ් 01, පර්. 0.

*දේපලට පිවිසීම.* - දඹුල්ල නගරයේ සිට මහනුවර මාතලේ පාර ඔස්සේ මහනුවර දෙසට කි. මී. 11.75ක් පමණ ගමන් ගත් පසු මෙම පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

***2 වැනි විකිණීම.*- 2022 ක් වූ මාර්තු මස 11 වැනි දින ප. ව. 3.30 ට**

*දේපළ විස්තරය .-*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ලියාපදිංචි කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ දූනගහ පත්තු දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 87 ඒ හපුවලාන ග්‍රාම නිලධාරී වසම මාපලන්ගෙදර ගමේ පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ. එම්. ජයපාල විසින් 2016.11.22 වැනි දින සාදන ලද පිඹුරු අංක 1825 හි නිරූපිත අංක 1 : 120 දරන ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගහකොළ වගාව ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 0.1117.

*දේපළට පිවිසීම.* - දිවුලපිටිය නගර මධ්‍යයේ සිට මීගමුව පාරේ කි. මී. 01ක් පමණ 12 වන සැතපුම් කණුව හන්දිය දක්වා (හොරගස්මුල්ල හන්දිය) ගමන් ගෙන වමට පිහිටි තාර පාරට හැරී

එම පාරේ මීටර් 900ක් පමණ ''ටී හන්දිය'' දක්වා පැමිණ වමට හැරී කොන්ක්‍රීට් පාරට පිවිස එම පාරේ මීටර් 500ක් පමණ ගමන් ගෙන වමට හැරී බොරළු පාර ඔස්සේ මීටර් 250ක් පමණ පාර අවසානය දක්වා ගමන් ගත් පසු අදාළ දේපල පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.10.11 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2019.10.15 වැනි දින ලංකාදීප, ඩේලිනිව්ස්, ද අයිලන්ඩ් හා වීරකේසරී පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. නොතාරිස් ගාස්තුව විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රුපියල් 2,500.00

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අංක 97, මහා විදිය, වේයන්ගොඩ.

දුරකථන අංක : 033 - 2246963, 033 - 2246964, 033- 2246973.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

02-125

---

**සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩබ්ලිව්. සී. තුෂාරි විසින් සහතික කරන ලද 2018.08.29 වැනි දින අංක 339 දරන සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ (1) තිරුචෙල්වම් ජස්ටින් (2) සුසිලා ජස්ටින් යන අය බන්ධනදායීන් වශයෙන් සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස්කර ඇති පහත විස්තර වන දේපළ **2022 ක්වූ මාර්තු මස 11 වැනි දින පෙ. ව. 11.00** ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ විස්තරය.* - කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු සල්පිටි කෝරලේ, වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි වසමේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ, කොට්ඨාස අංක 43, වැල්ලවත්ත උතුර, පීටර්සන් පටුමගෙහි පිහිටි ඉඩමට බලයලත් මානක කේ. සෙල්වරත්නම් මහතා විසින් මැන සාදන ලද 2008.08.21 දිනැති සහාධිපත්‍ය අංක 11114 දරන කොළඹ 6 පීටර්සන් පටුමග, වරිපනම් අංක 26 - 6/1 දරන 6 වන මහලේ නේවාසික සහාධිපත්‍ය කොටස SIFB ආලින්දය, කෑම කාමරය, නිදන කාමර 2, ප්‍රධාන කාමරයක්, මුළුතැන්ගෙයක් වැසිකිළි 2ක් සහ බැල්කනියකින් සමන්විත හා පොදු අංග උපාංග සඳහා වන නොබෙදූ අයිතිය 5.555% වන අතර CE 13 සඳහා ප්‍රවේශය ද වේ. ප්‍රමාණය වර්ග මීටර් 93.00 (බැල්කනිය සමග) වර්ග අඩි 1000,

*දේපළට පිවිසීම.* - කොළඹ වැල්ලවත්ත හන්දියේ සිට ඩබ්. ඒ. සිල්වා මාවත ඔස්සේ මීටර් 500ක් පමණ ගමන් ගෙන දකුණට පිවිස පීටර්සන් පටුමගට පිවිස එම පටුමගේ මීටර් 100ක් පමණ ගමන් ගත් විට අදාළ දේපළ මෙම පාරේ දකුණ පසින් පිහිටි මයිරා කෝට් (Myra Court) මහල් නිවාස සංකීර්ණය 06 වන මහලේ අංක 26/6/1 දරන දේපළ වේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.10.30 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2019.11.22 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,

5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රුපියල් 3,000.00

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : අංශ ප්‍රධානි ණය අයකිරීම් සහ එකතුකිරීම් සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපොන, කොළඹ 06.

දුරකථන අංක : 011- 283 2500.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 071 4 962 449/07 8 446 374

02-126

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව අන්සාර් මොහොමඩ් අරූස් යන අය බන්ධනදායි වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් ලියා සහතික කරන ලද අංක 591 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**2022ක් වූ මාර්තු මස 14 වැනි දින පෙ. ව. 10.30 ට**

*දේපළ විස්තරය* (උකස් බැඳුම්කර අංක 591 මගින් උකස් කර ඇති දේපල)
වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුව තිරගංදහය කෝරළේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාතව ග්‍රාම නිලධාරි වසම නාකල්ගමුව ගමේ පිහිටි ගමවෙල ජීවන්ගනේ අන්දහේන දූන් වත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩබ්ලිව්. ආරියරත්න විසින් 2013.05.28 වැනි දින මැන සාදන ලද අංක 178/2013 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගහකොළ වගාව ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : අ. 0, රූඩ්. 0, පර්. 38.62 ක විශාල ඉඩම.

*දේපළට පිවිසීම-* කුරුණෑගල නගරයේ සිට කොළඹ පාරේ දම්බොක්ක හන්දිය දක්වා ගමන් ගෙන වමට හැරී රඹුක්කන පාරට පිවිස (කටුපිටිය හරහා) එම පාරේ කි. මී. 01.95ක් පමණ ගමන් ගත් පසු අදාළ දේපළ මෙම පාරේ වම් පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුතිය සඳහා 2021.04.23 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද , 2021.04.20 වැනි දින ඩේලිනිවුස්, ලංකාදීප හා වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රුපියල් 3,000.00

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

මෙම වෙන්දේසිය නතර කිරිමට හෝ අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු නගර ශාඛාව, කුරුණෑගල, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී., අංක 140 සී, කොළඹ පාර, කුරුණෑගල.

දුරකථන අංක : 037 2 229 588.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449
e.mail.wijeratnejayasuriya@gmail.com

02-127

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා මහනුවර නගර සභා සීමාව තුළ අංක 221 තල්වත්ත ග්‍රාම නිලධාරී වසම තල්වත්ත ගමේ පිහිටි රොඩුපිහිල්ල වත්ත කොටසක් රොඩුපිහිල්ල වත්ත ලොට් අංක 01 හා බලයලත් මානක එල්. ඒ. ද සී විජේතුංග 1973 දෙසැම්බර් මස 10 වැනි දින මැන සාදන ලද අංක 5409/5 දරන පිඹුරේ සඳහන් ලොට් 5 බී සහ 5 ඒ කොටසක් දරන ඉඩම බලයලත් මානක ඩී. ආර්. අමේන්ද්‍ර විසින් 2016.02.26 වැනි දින (නැවත මැන ඒකාබද්ධ කොට කරන ලද අතුරු බෙදීමක්) මැන සාදන ලද අංක 2030 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 2, 3, 4 දරන එකට යා වූ ඉඩම් කොටසක් වන බෙද වෙන් කළ වරිපනම් අංක 102/147 (ලොට් අංක 02) 102/145 සහ 102/146 (ලොට් 03) සහ රොස්නීත් නමැති බෙද වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය අක්. 01, පර්. 30.33

මෙම දේපළ මහනුවර කටුගස්තොට පාර අංක 396 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන අශෝ කාර්ස් ජැපෑන් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇත.

*දේපළට පිවිසීම.*- මහනුවර නගරයේ සිට මහියංගනය ප්‍රධාන පාරේ කි. මී. 03ක් පමණ තල්වත්ත දක්වා ගමන් ගෙන දකුණට පිහිටි රණවිරු චන්ද්‍රන කුමාර ගමගේ මාවතට පිවිස එම මාවතේ මීටර් 500ක් පමණ ගමන් ගත් පසු අදාළ දේපළ පිහිටා තිබේ. (''ජෙම් ඉන්'' නමින් පිහිටි දේපල)

**2022 ක් වූ මාර්තු මස 14 වැනි දින ප.ව. 2.30ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.07.19 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද , 2019.07.15 වැනි දින මව්බිම, ද අයිලන්ඩ් හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :* කළමනාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී., අංක 120, කොටුගොඩැල්ල වීදිය, මහනුවර.

දුරකතන අංක : 081-2223163 - 081 - 2234392 - 081 - 2223217

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකතන අංක : 081-2210595/ 071-8446374/071-4962449

02-128

---

**අමානා බැන්ක් පී.එල්.සී. - කින්නියා ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අමානා බැන්ක් පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව සබුර්දීන් මොහාමඩ් අලී යන අය බන්ධනදායි වශයෙන් අමානා බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*1 වැනි විකිණීම.* - **2022 ක් වූ මාර්තු මස 18 වැනි දින පෙ. ව. 11.15 ට**

*දේපළ විස්තරය.* - නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තම්පලගාමම් පත්තුවේ කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කින්නියා ග්‍රාම නිලධාරී වසම ඇතුළත කින්නියා නගර සභා සීමාව තුළ සින්න කින්නියා ගමේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු වන එන්. ෆාරුක් විසින්

නැවත මැන සාදන ලද 2016.06.07 වැනි දින අංක 1777 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 යනුවෙන් සළකුණු කරන ලද බෙද වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ඇතුළු අනෙකුත් සියලු දේ සමග ඉඩමේ ප්‍රමාණය රූඩ් 01,

*දේපළට පිවිසීම.* - කින්නියා බුහාරි හන්දියේ සිට කෙලින් වීදියේ කින්නියා තම්පලකාමම් ප්‍රධාන පාරේ මඩකලපුව දෙසට කි. මී. 1.3 ක් පමණ පැරණි රෝහල හන්දිය දක්වා ගමන් ගෙන දකුණට හැරී මඩකලපුව පාර ඔස්සේ මීටර් 450 ක් පමණ ගමන් ගත් පසු අද දේපළ මෙම පාරේ දකුණු පසින් පිහිටා තිබේ.

*2 වන විකිණීම.* - **2022 ක් වූ මාර්තු මස 18 වැනි දින පෙ. ව. 11.45 ට**

*දේපළ විස්තරය* .- නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තම්බලගාමම් කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කින්නියා ග්‍රාම නිලධාරි වසම ඇතුළත කින්නියා නගර සභා සීමාව තුළ සිත්න කින්නියා ගමේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරුවන එන්. ෆාරුක් විසින් නැවත මැණ සාදන ලද 2018.04.27 වැනි දින අංක 3799 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 යනුවෙන් සළකුණු කරන ලද බෙද වෙන් කළ ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරුවන කේ. සෙල්ලප්පිල්ලෙයි විසින් මැන සාදන ලද 1998.12.17 වැනි දින අංක 1005 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 සහ ලොට් අංක 02 දරන කින්නියා තෝඩ්ඩම් නැමති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ඇතුළු අනෙකුත් සියලු දේ සමග ඉඩමේ ප්‍රමාණය පර්. 32.5

*දේපළට පිවිසීම.* - කින්නියා බුහාරි හන්දියේ සිට කෙලින් වීදියේ කින්නියා තම්පලකාමම් ප්‍රධාන පාරේ මඩකලපුව දෙසට කි. මී. 1.3 ක් පමණ පැරණි රෝහල හන්දිය දක්වා ගමන් ගෙන දකුණට හැරී මඩකලපුව පාර ඔස්සේ මීටර් 450 ක් පමණ ගමන් ගත් පසු හමුවන සුළු හන්දියෙන් (Minor Junction) දකුණට හැරී එම පාරේ මීටර් 120ක් පමණ ගමන් ගෙන නැවත දකුණට හැරී එම පාරේ මීටර් 30 පමණ ගමන් ගත් පසු හමුවන පුද්ගලික පටුමග ඔස්සේ කෙලින් ම මීටර් 10 පමණ ගත් පසු අදළ දේපළ මෙම පටු මගේ දකුණු පසින් පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2020.12.18 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද, 2020.12.18 වැනි දින දිවයින, ඩේලිමිරර් හා තිනක්කරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු සහ වෙනත් ගාස්තු ඇත්නම් එම මුදල ,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් ගාස්තු,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රුපියල් 3,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත අමානා බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න* : අය කිරීම් කළමණාකරන ප්‍රධානී අමානා බැන්ක් පීඑල්සී අංක 486, ගාළු පාර කොළඹ 03. දුරකතන අංක : 011 -7756000 දිගුව 2112

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081 - 2210595/
071 - 8446374 / 071 - 4962449.

02-129